**01.** පහත දී ඇති ඡේද ඇසුරින් අසා ඇති සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. ප්‍රශ්නවලට වර්තමාන ලිඛිත බසින් ම පිළිතුරු සැපයිය යුතු යි.

(අ) එතෙපුල් අසා කරුණාපර බුද්ධපුත්‍ර වූ මහ තෙරුන් වහන්සේ ඔහු මහණ කොට උපසම්පදා කැරවූ සේක. එතැන් පටන් උන් වහන්සේ වත්පිළිවෙත්හි යෙදී අප්‍රමාද ව භාවනා කරන සේක් නො බෝ කලකින් රහත් ව හරන්තික මහ තෙරුන් වහන්සේ ය යි ප්‍රසිද්ධ වූ සේක. එසේ හෙයින් යම් කිසි කෙනෙක් පළමු වන වයස පඤ්චකාමයෙහි ගිජු ව නොයෙක් අකුසල් කිරීමෙන් පාපිෂ්ඨ ව ඇවිද්දාහු වී නමුත් පසු ව කාරණාකාරණ දන්නා වයසට පැමිණ යෞවනමදය, ආරෝග්‍යමදය, ජීවිතමදය යන ත්‍රිවිධ මදාදීන් මත් ව කුසල් කිරීමෙහි ප්‍රමාද වීම සසර දුක් විඳීමට ඒකාන්ත කාරණය යි නුවණින් සලකා ප්‍රාණාතිපාතය, අදත්තාදානය, කාමමිථ්‍යාචාරය, මුසාවාදය, සුරාපානය යනාදි වූ අකුශල ධර්මයන් දුරු කොට ගෘහස්ථ ප්‍රව්‍රජිතාදි වූ ඒ ඒ භාවයට සුදුසු වූ කුශල ක්‍රියාවන් රැස් කළේ වී නම් එසේ වූ උත්තම සත්ව තෙම බුදු පසේබුදු මහ රහතන් වහන්සේ විසින් පසස්නා ලද්දා වූ දිව්‍ය මනුෂ්‍ය සම්පත් විඳ ශාන්ත වූ ප්‍රණීත වූ උතුම් වූ අමාමහ නිවන් පුරයටත් පැමිණෙන්නාහු ම ය.

i. මදයෙන් මත් වූවෝ කුමක් කරත් ද?
ii. තුන්තරා බෝධිය උපුටා දක්වන්න.
iii. නුවණින් සලකන්නෝ කුමක් කරත් ද?
iv. **පළමු වන වයස පඤ්චකාමයෙහි ගෘහස්ථ, ප්‍රව්‍රජිතාදි** යන පදවල අර්ථ දක්වන්න.

(ආ) උන්ගේ දෙමව්පියෝ ජාතීනුත් සම්පත්තීනුත් සම තරම් වූ සිටුපුත්‍රයාණ කෙනෙකුන්ට සරණ දෙන්ට නියම ව දවස් නියම කළහ. නකත් දවස් උදවු කලට සිටුදුවණියෝ බැඳී වසන කොල්ලාට කියන්නෝ 'මා අසවල් දවස් අසවල් සිටුපුත්‍රයාණන්ට සරණ දෙති. මා උන් කරා සරණ ගිය කල පඬුරක් හැරගෙන ගිය නමුත් ඔබිනුත් වෙන ම රකවල් හෙයින් දක්නා පමණකටත් නො ලබව. ඉදින් මා කෙරේ ප්‍රේමයෙක් ඇත්නම් ඔබ නො යන තෙක් දැන් ම මා කැඳවාගෙන කැමති තැනකට යව' යි කිවු ය. උයිත් යහපතැයි ගිවිස 'එසේ වී නම් මම සෙට දවස් නුවර වාසල කෙරේ අසවල් තැන සිටිමි. මුඹත් එක් උපදෙසකින් කාටත් නො හැඟෙන ලෙස එතනට අවමැනවැ' යි කියාලා දෙවන දවස් කියාලූ තැන ම සිටියහ. සිටුදුවණියෝ ද දෙවන දවස් කිලුටු අදහස් සේ ම කිලුටු කඩරෙද්දක් කොයින් දෝ සොයා හැඳගෙන මිඩියන්ගේ ලෙසට ලිහිල් කොට හිසකේ බැඳගෙන රැ දෙවරු වී පැහැරියා සේ ඇඟ මුළුල්ලෙහි ධූලි ගාගෙන කළයක් හැරගෙන පැනට යන කෙල්ලක මෙන් කෙල්ලන් හා එක් ව ගෙන් පිටත් ව මිඩිවෙස් ගත් ලෙසට කොල්ලා සිටි තැනට ගියහ. ඒ කොලු ද ක්‍රියාවෙන් කුම් වුවත් ජාතීන් හා සම්පත්තීන් උතුම් තරම් ඇති සිටුදුවණියන් රෙදිකඩෙකින් වසාලූ මැණිකක් පරිද්දෙන් කැඳවාගෙන දුරට ගොසින් එක් ගමෙක රඳාහිඳ අයට අඳයට සී සාගෙන, වප් වපුටගෙන දර පලා ගෙනවුත් ජීවත් වෙති.

i. සිටුදියණියන් මෙසේ පැන ඒමට හේතු කවරේ ද?
ii. සිටුදියණියන් පැමිණෙන්නේ කෙසේ ද?
iii. සිටුදියණියගේ පෙම්වතා ඇය ව රැගෙන යන්නේ කෙසේ ද?
iv. **රැ දෙවරු වී, මිඩිවෙස්, වප් වපුටගෙන, අඳයට** යන පදවල අර්ථ දක්වන්න.

(ඇ) එකෙණෙහි වැදිපුත්‍ර තෙම කියනුයේ 'ඇසුව මැනව. ඇත්රජ්ජුරුවන් වහන්ස, කසී රජ්ජුරුවන්ගේ සුභද්‍රා නම් අගමෙහෙසුන් බිසවක් ඇත. ඕ තොම සිහිනෙන් තොප දැක සවනක් රැස් විහිදෙනා මේ දළ දෙකින් පළඳනාවක් කරවනු කැමැත්තෙමි යි දොළ බැඳ රජ්ජුරුවන් වහන්සේට දන්වා එරට වැදිපුත්‍රයන් කැටි කරවා මා ම නිසි ය යි තෝරාගෙන මංසලකුණු කියා එවූහ. එබැවින් විද්දෙමි' යි කීයේ යි. එබස් අසා මහා බෝධිසත්ත්ව තෙම 'වැලි මේ චුල්ල සුභද්‍රාවන්ගේ මෙහෙවරක් නිසා වේ දැයි තමාට මාගේ දළින් ප්‍රයෝජන නැත. මා මරවනු පිණිස මොහු එවූ ය' යි ප්‍රකාශ කරන්නේ මෙලෙස කියා: 'මාගේ පියාණන් මුත්තණුවන් වහන්සේගේ දළ නො නස්නා පිණිස ගල්ගුහා ආදියෙහි තුබූ බැව් දැන මාගේ දළ දෙක ම ගෙනෙව යි තොප ම එවන තැනැත්තී මා කළ යම්තම් වැරද්දක් සිත් තබා තමා බැඳි වෛර ම සිද්ධ කොට මෙසේ වූ රෞද්‍ර ක්‍රියාවකින් මුදුන්පත් කළා ය. එබැවින් මා නො මියන තෙක් වහා දළ කපා ගනුව' යි කීයේ ය.

i. සුභද්‍රාවන්ට ඇති වූ දොළ කුමක් ද?
ii. ඇතු නො මරා දළ යුවළක් ලබාගත හැක්කේ කෙසේ ද?
iii. සුභද්‍රා අගමෙහෙසිය ඡද්දන්ත ඇතුට වෛර බැඳ ඇත්තේ කුමක් නිසා ද?
iv. **කපාගනු, ඇසුව මැන ව, බැඳි** යන ක්‍රියා නම් කරන්න.

02. පහත දී ඇති පද්‍ය ඇසුරින් අසා ඇති සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. ප්‍රශ්නවලට වර්තමාන ලිඛිත බසින් ම පිළිතුරු සැපයිය යුතු යි.

(අ)

මෙ අප නර පවරා
මනු නය සිරිත් සපුරා
නො හැර සිවු සඟරා
ලොවට නිරතුරු කෙරෙයි සඟරා

ගත් මෙන් නව නඳන්
කෙරෙමින් කලි අතුරුදන්
කර තම සිත නඳන්
දේ ය අවුරුදු පතා මහ දන්

මෙ අප නරනින්දේ
රජ දහම සිත රැන්දේ
තොස් සිඳු කිමින්දේ
නොයෙක් බමුණනට නිති දන් දේ

i. සිව් සඟරා කවරේ ද?
ii. සතුට කුමකට රූපක වේ ද?
iii. අවුරුදු පතා රජතුමා දන් දී අතුරුදන් කළේ කුමක් ද?
iv. **නඳන්, මනු නය, නර පවරා, රජ දහම්** යන පදවල අර්ථ දක්වන්න.

(ආ)

විල් තෙර වළ බිඳ හෙව මඩ තවරා
ලොල් කර හෙළ නෙළුඹල කමිනුදුරා
බොල් කෙළ පෙණ පිඩු දෙකොළින් වගුරා
වල් වැද එන ඌරන් දකු ඉදුරා

වැද සෙද උනුනට පසු නො බසිමිනේ
බිඳ බිඳ මී අඹ කැන් ගෙන අතිනේ
ඇද ඇද තුරු වැළ ගළපන ලෙසිනේ
රොද බැඳ එන රිළවුන් බල තොසිනේ

i. වල් ඌරන්ගේ ස්වරූපය කෙබඳු වී ද?
ii. රිළවු වහා කුමක් කරත් ද?
iii. රිළවුන්ගේ ස්වරූපය කවියා දකින්නේ කෙසේ ද?
iv. **නෙළුඹල, කමිනුදුරා, උනුනට** යන පද විසන්ධි කරන්න.

03. පහත සඳහන් උද්ධෘතයන් සඳහා **අවස්ථා සම්බන්ධය** ලියන්න.

i. 'තොප කළ සේ නො යෙදෙයි. මිත්‍රද්‍රෝහ නම් යහපත් දෙයක් නො වෙයි'
ii. 'මමත් දෙබෑයන් වහන්සේ සමඟ යෙමි'
iii. 'මමත් මුඹ වහන්සේ වැනි බුදුකෙනෙකුන්වහන්සේ සමයෙක මේ තනතුරු ලැබෙම්ව'
iv. 'ස්වාමිනී, අශෝකමාලා දේවීන් වහන්සේට ගෙන බෙහෙත් කැඳිත්තකැයි'

04. මෙම ප්‍රශ්නයෙහි සියලු ම අනුකොටස්වල **නිවැරදි වරණය** තෝරන්න.

1. **ව්‍යාකරණානුකූල ව නිවැරදි වාක්‍යය** තෝරන්න.

i. වේදේහ රජ්ජුරුවෝ සේනකයෝ විමසූ හ.
ii. විදුහල්පතිතුමිය ශිෂ්‍යාවෝ අමතා ව්‍යාපෘති සැලසුම් විග්‍රහ කළා ය.
iii. කාන්තා විමුක්තිය ගැන වැඩියෙන් මොර දෙන්නේ කාන්තා හිංසකයෝ ය.
iv. දෛනික කාල සටහන ක්‍රියාත්මක කිරීම අපගේ යුතුකමක් වෙති.
v. අවිනීතයෝ දුර්වලයෝ නො වෙති.

2. **නිපාතයක් රහිත** වරණය තෝරන්න.

i. හෙට  ii. ඊයේ  iii. එව්
iv. සේ  v. නි

3. **අර්ධ නාසික්‍ය** අකුරක් සහිත වරණය තෝරන්න.

i. ඤ  ii. ය  iii. ළ
iv. ෆ  v. ජ

4. **අක්ෂර වින්‍යාසය** නිවැරදි වරණය තෝරන්න.

i. උළෙල, කලළ, බළලා
ii. ප්‍රබල, සුලභ, අභිණය
iii. සුලඟ, ඔළිඳ, විළඳ
iv. සම්ප්‍රදාය, ප්‍රස්තාව පිරුළු, අභිෂේකය
v. නර්ථනය, දර්ශනය, විකර්ණය.

5. **කාලාර්ථයේ අසම්භාව්‍ය ක්‍රියාවක්** සහිත වරණය තෝරන්න.

i. දුවද්දී ii. නැටුවොත් iii. නැටුවේ ය
iv. නැටුවා ය v. නටවා

6. '**අංජන**' යනු

i. හඳුන් ය ii. කළු ය iii. තිලකය
iv. රත් හඳුන් ය v. සුදු හඳුන් ය

7. '**දෛවෝපගත**' සිදුවීමක් ලෙස එය හැඳින්වේ. මෙහි ඇත්තේ

i. පූර්වස්වර ලෝපයකි. ii. පරස්වර ලෝපයකි.
iii. ස්වර සන්ධියකි. iv. ස්වරාදේශයකි.
v. ගාත්‍රාදේශයකි.

8. නිවැරදි **අනුරූප සංයෝගය සහිත** වරණය තෝරන්න.

i. පාණ්ඩුකම්බල ශෛල අසුන
ii. සත් දේවේන්ද්‍රයා
iii. සදහම් දිවයින
iv. ක්ෂේත්‍රබිම
v. කල්‍යාණ නදිය

9. '**අනුපමා**' යන්නෙහි නිවැරදි විසන්ධිය වන්නේ

i. අනු + උපමා ii. න + උපමා iii. නි + උපමා
iv. අනු + පම v. අන් + උපමා

10. **යුගළ පදයක් නො මැති** වරණය තෝරන්න

i. යනඑන, පොත්පත්, නැතිබැරි
ii. දුකසැප, ගොඩමඩ, ඉනඉහ
iii. අරුමපුදුම, අරුමෝසම්, වාදභේද
iv. යානවාහන, අතමිට, ඉටුඅනිටු
v. අල්ලාපසල්ලාප, ඉවක්බවක්, වැඩඅවැඩ

11. **ව්‍යාකරණානුකූල ව එක ම වර්ගයකට අයත් නො වන** වරණය තෝරන්න.

i. ක්‍රියා - බලයි, කියකියා, බමයි
ii. සමාස - කැලැමල්, දසසිල්, මව්පිය
iii. කෘදන්ත - ලියුම්, කැවිලි, සිඟමන්
iv. තද්ධිත - අරටු, මැණියෝ, දේශීය
v. උපසර්ග - අවමානය, අටවක, සුවිසල්

12. '**කිසිදු තොරතුරක් නො දන්නෙකු මෙන්**' යන්නට වඩාත් ගැළපෙන සාම්ප්‍රදායික යෙදුම සහිත වරණය තෝරන්න.

i. ගොඩපෙරකදෝරුවෙකු මෙන් ii. අන්ද මන්ද වූවෙකු මෙන්
iii. හාංකවිසියක් නො දන්කෙු මෙන් iv. ගොළුවෙකු මෙන්
v. නරුමයෙකු මෙන්

13. '**ගුරුතුමාගේ බසට ඔහු අවනත විය**' මෙහි බසට යන්නට වඩාත් ගැළපෙන වරණය තෝරන්න.

i. බස සඳහා  ii. බස උදෙසා  iii. බස පිණිස
iv. බසින්  v. බස කෙරෙහි

14. '**ර**' අක්ෂරය උත්පත්ති ස්ථානය අනුව අයත් වන්නේ

i. කණ්ඨජ  ii. තාලුජ  iii. මූර්ධජ
iv. දන්තජ  v. ඕෂ්ඨජ

15. **හලන්ත ප්‍රකෘතියක් සහිත** වරණය තෝරන්න.

i. ගව  ii. බැටළු  iii. මිනිස්
iv. වැදි  v. නරි

16. **මුල් පදයේ ඇති අනුප්‍රාසය අපර පදයට යෙදීමෙන් සැකසී ඇති පිරුළ** ඇතුළත් වරණය තෝරන්න.

i. පරංගියා කෝට්ටේ ගියා වාගේ.
ii. තැනේ හැටියට ඇණේ
iii. ගිලී මලෙත් ඇත දත සුද්දා
iv. පොට්ටකාසිය පිං කැටේට
v. හැදෙන ගහ දෙපැත්තෙන් දනේ

17. සිංහල ව්‍යාකරණයෙහි **සන්ධි, සමාස, විභක්ති සංඛ්‍යාව** පිළිවෙළින් නිවැරදි ව දක්වා ඇති වරණය තෝරන්න.

i. 10, 07, 09  ii. 10, 05, 10  iii. 10, 05, 08
iv. 90, 05, 10  v. 10, 05, 09

18. **පුරුෂවාචී පදයක මුලට ස්ත්‍රීවාචී පදයක් යෙදී සැකසුණ ස්ත්‍රීවාචී පදය** සහිත වරණය තෝරන්න.

i. මාගම් සඟුන්  ii. සුර දූතිය  iii. නරි නාටක
iv. සෙබළ ලිය  v. මානවිකා

19. '**එකුන් සැට**' යනු

i. 61  ii. 64  iii. 54  iv. 160  v. 59

20. '**පුතා**' යන්නෙහි අනියමාර්ථ අනුක්ත රූපය වන්නේ

i. පුත්තු  ii. පුතුන්  iii. පුතෙකු  iv. පුතෙක්  v. පුතෙකුට

05.

(අ) පහත සඳහන් වාක්‍යවල **සදොස් තැන් ඇතොත් නිදොස් කර** ලියන්න.

i. මෙහි ක්‍රීඩා තරගයට ආදි සිසුන් ද සහභාගි වූ හ.
ii. අපි සියල්ලන් ම එම අදහසට එකඟ වූවෙමු.
iii. අයෙක් ගී කියන හඬට ඇතැමෙකු අකමැති වූ හ.
iv. මම ගුරුවරු ද ළමයි ද හමුවට ගියෙමු.
v. තෝ විසින් මා දක්නා ලද්දෙහි.

(ආ) **වාක්‍ය නිවැරදි වීම සඳහා සුදුසු පද** වරහන් තුළින් තෝරා ලියන්න.

i. මෙවර (අපේක්ෂකයෝ / අපේක්ෂකයන්) ජය ගනිති යි (මම / මා) (නො සිතයි / සිතමි)
ii. පාසල් වහලය උඩ (කම්කරුවෝ / කම්කරුවන්) ඇත.
iii. 'නරිබෑනා' ලියුවේ දයානන්ද (ගුණවර්ධනයන් ය / ගුණවර්ධනයෝ ය).
iv. පොලිස් (නිලධාරියා / නිලධාරිහු) (සොරු / සොරුන්) ඇල්ලූ හ.
v. (මා හිමි / මා හිමියෝ) වෙහෙරට (වඩිති / වඩියි)

(ඇ) පහත සඳහන් වාක්‍ය **කර්මකාරකයට** හරවන්න.

i. පැරකුම්බාවෝ රට සහලින් පෝෂණය කළහ.
ii. නංගී ඉතා මිහිරි ගීයක් ගයන්නී ය.
iii. මම තා දුටුවෙමි.
iv. කාන්තාවක් දරුවෙකු වඩාගෙන මහ මඟ යයි.
v. පියාණෝ නිති දරුවන් රකිති.